සැ. යු. - 2009.04.24 දින පළ වූ අංක 1,599 දරන ගැසට් පත්‍රයේ I/III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,600 - 2009 අප්‍රේල් මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2009.04.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 564 |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | 566 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 567 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 මැයි මස 07 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 අප්‍රේල් මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**රා තැබෑරුම් රේන්ද විකිණීම- 2009/2010 වර්ෂය**

2009 ජූලි මස 01 සිට 2010 ජුනි මස 30 දක්වා පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

2009 ජූලි මස 01 දින සිට 2010 ජුනි මස 30 දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982.08.20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි සහ සෑම සුරාබදු බලපත්‍රයක්ම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩර් පත්‍රයක් ම පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගන්නා නියමිත ආකෘති පත්‍රයෙන් සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සිය හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයන් යටත් පිරිසෙයින් 15%කට ලබාගත් වටිනාකම සහතිකයක් ද ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සැලසුම් කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ 'අංක .................................... දරන .......................................... රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය' යනුවෙන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2009.05.18 දින පෙ. ව. 10.00 ට පෙර පුත්තලම ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර පුත්තලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට ඇතුළත් විය යුතුය.

05. 2009.05.18 වැනි දින පෙ. ව. 10.00 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියළුම ටෙන්ඩර්කරුවන් පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

ඒ. සී. එම්. නෆීල්,
ප්‍රාදේශීය ලේකම්,
පුත්තලම.

2009 අප්‍රේල් මස 06 වැනි දින,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, පුත්තලම.

**උපලේඛනය**

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|---|---|
| 01 | පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | සේනකුඩිරිප්පුව | පෙ. ව. 11.00<br>ප. ව. 5.00 | ප. ව. 2.00<br>රාත්‍රී 8.00 | 2009.05.18<br>පෙ. ව. 10.00 | 1,000 |

04-602

## රා තැබෑරුම් රේන්ද විකිණීම- 2009/2010

2009 ජුලි මස 01 දින සිට 2010 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982.08.20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි සහ සෑම සුරාබදු බලපත්‍රයක්ම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවන්ට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ආකෘතිපත්‍රයක සකස් විය යුතු වන අතර, පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැම්පත් කළ බවට කුවිතාන්සියක් හා අදාල ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයන් යටත් පිරිසෙයින් 15%කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ 'අංක .................................... දරන .......................................... රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය' යනුවෙන් පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ අංකය සහ නම සඳහන් කොට 2009.05.18 දින සිට 2009.05.25 වැනි දින පෙ. ව. 10.00 ට පෙර වෙන්නප්පුව ප්‍රාදේශීය මහ ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවටම පෙර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුය.

05. 2009.05.25 වැනි දින පෙ. ව. 10.00 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියළුම ටෙන්ඩර්කරුවන් වෙන්නප්පුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි රා තැබෑරුම් නැවත විකිණීම 2009.06.08 දින පෙ. ව. 10.00 ට සිදු කරනු ලැබේ. එදින ද ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවන්ට අනුකූල විය යුතුය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

එම්. ඩී. නාමරත්න,
ප්‍රාදේශීය ලේකම්,
වෙන්නප්පුව.

### උපලේඛනය

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම් ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|
| 01. | වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | තඹරවිල | 2009.05.25 පෙ. ව. 10.00 ට | 500 |
| 02. | එම | නනජුන්ඩනකරේ | එම | 250 0 |
| 03. | එම | වයික්කාල | එම | 1,000 0 |
| 04. | එම | බොරලැස්ස | එම | 500 0 |
| 05. | එම | දුම්මලදෙනිය | එම | 1,000 0 |
| 06. | එම | උල්හිටියාව | එම | 500 0 |
| 07. | එම | ලුණුවිල | එම | 500 0 |
| 08. | එම | වෙන්නප්පුව | එම | 2,000 0 |
| 09. | එම | නයිනමඩම | එම | 1,000 0 |

| *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වැසිය යුතු වේලාව* |
|---|---|
| පෙ. ව. 11.00ට | ප. ව. 2.00 |
| ප. ව. 5.00 | ප. ව. 8.00 ට |

04-611

**2009/2010 වර්ෂය සඳහා මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම**

2009.07.01 සිට 2010.06.30 දක්වා

2009 ජූලි 01 දින සිට 2010 ජූනි 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසිය හා සෑම සුරාබදු බලපත්‍රයක්ම සඳහා අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණය යටත් පිරිසෙයින් 15%කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතුයි.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි 'අංක 13 දරන පම්බල රා තැබෑරුම' සඳහා ටෙන්ඩර් පත්‍රය වෙනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි රා තැබෑරුමෙහි නම සහ අංකය සඳහන් කොට 2009 මැයි 26 වැනි දින පෙ. ව. 10.00 ට පෙර මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුයි.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.05.02 දින පළ වී ඇති අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුය.

05. 2009 මැයි 26 දින පෙ. ව. 10.00 වී ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2009.06.09 දින පෙ. ව. 10.00 ට සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අදාළ විය යුතුය.

මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

වික්‍රම වරාගොඩ,
ප්‍රාදේශීය ලේකම්.
මාදම්පේ.

*උපලේඛනය*

| *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ.* |
|---|---|---|---|---|
| උතුරු පිටිගල් කෝරළය | පම්බල | 13 | 2009.05.26 පෙ. ව. 10.00 | 1,000 |

04-639

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

**පී. සී. එල් ක්‍රියේටර්ස්**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම සම්බන්ධ ප්‍රසිද්ධ දැන්වීම

පී. සී. එල්. ක්‍රියේටර්ස් 2009 මාර්තු මස 25 වන දින සමාගම වශයෙන් ලියාපදිංචි කල බව මෙයින් දන්වා සිටිමු.

සමාගමේ ලියාපදිංචි අංකය : ජීජ් 2242
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 86 ජී 1 ඩිවර්ටන් පේරාදෙනිය

ස වාසවත්,
සමාගම් ලේකම්.

55F 1/4, පලමු මහල, මැනිං පෙදෙස,
කොළඹ 06.

04-628

**හැරිස් බ්‍රෂස් ඇන්ඩ් ජෙනරල් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2009 මාර්තු මස 12 වැනි දින දී සමාගම ලියාපදිංචි අංක පීවී 67261 යටතේ 'හැරිස් බ්‍රෂස් ඇන්ඩ් ජෙනරල් ඉස්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්' යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 03, ධර්මපාල මාවත, අංක 53/1 දරන ස්ථානයෙහි බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

ඒඑම් ඇන්ඩ් ඒඑන් සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ ලේකම්වරු).

එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
5 වන තලය,
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.
04-632

### දැන්වීමයි

2007 ව්‍යාපාර නාම ආඥාපනතේ 07 වන වගන්තියේ 9 පරිච්ඡේදයේ (1) කොටසට අනුකූලව පහත දැක්වෙන ව්‍යාපාරය සංස්ථාවක් ලෙස ලියාපදිංචි කළ බව මෙම දැන්වීමෙන් දන්වා සිටිනු ලැබේ :

1. ව්‍යාපාරයේ නම : යූරෝනිපොන් මැෂිනරි එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. ලියාපදිංචි කළ දිනය : 2009 අප්‍රේල් මස 07 වැනි දින
3. ව්‍යාපාර අංකය : පී වී 67529
4. ලියාපදිංචි ලිපිනය : අංක 204/1, ගාලු පාර, තල්පිටිය උතුර, වාද්දුව.

ලේකම්,
එකවින්ටන් ඇන්ඩ් ඇලයිට් සර්විසර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2009 අප්‍රේල් මස 16 වැනි දින.

04-631

---

### දැන්වීමයි

2009.03.03 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ

සමාගමේ නම : ග්‍රීන්විච් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 67191
ලියාපදිංචි කාර්යාලය : අංක 34, ගාලු පාර, දෙහිවල.

ආර්. සෙන්දිල්කුමරන්,
ලේකම්,

2009 මාර්තු මස 16 වැනි දින.

04-629

---

### මහජන දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 241 වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනය

සීමාසහිත ලංකා ඔරික්ස් ලීසිං පීඑල්සී - පී කියු 70 (LOLC) සහ එල්ඕඅයි බී පයිනෑන්ෂල් සර්විසස් පී. බී. 134 (LFSL) යන සමාගම්හි අධ්‍යක්ෂ මණ්ඩලයන් විසින් 2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 241 වැනි වගන්තිය අනුව ඉහත සමාගම් දෙක ඒකාබද්ධ කිරීමට තීරණය කර ඇත.

මෙම ඒකාබද්ධ කිරීම යටතේ - LFSL සමාගම් සියලු කොටස් අහෝසි වන අතර LOLC සමාගම වෙනුවෙන් කිසිදු ගෙවීමක් හෝ වෙනත් ආකාරයක සලකා බැලීමක් සිදු කරනු නොලැබේ. සීමාසහිත LOLC සමාගම LFSL සියලු කොටස් පවරා ගැනීමෙන් සීමාසහිත LFSL සමාගමේ සියලු වත්කම් හා බැරකම් ද පවරා ගනු ලැබේ.

LOLC සමාගමේ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය LOLC සහ LFSL ඒකාබද්ධ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ක්‍රිෂාන්ති එමානුවෙල් මෙනෙවිය,
සමාගමේ ලේකම්.

2009 අප්‍රේල් මස 07 වැනි දින.

04-630

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කිරීම අපි දැනුම් දෙන්නෙමු

සමාගමේ නම : පිරිපුන් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 92, ධර්මපාල මාවත, කොළඹ 07
සමාගමේ අංකය : පී. වී. 67466
සංස්ථාගත කිරීමේ දිනය : 2007 මාර්තු තිස්එක් වන දින.

ප්‍රොෆෙෂනල් එසයිමන්ට්ස් ඇන්ඩ් සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් සෙක්‍රට්‍රීස්.

2009 අප්‍රේල් මස 7 වැනි දින.

04-619

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### මහජන බැංකුව - මලියදේව ශාඛාව

1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

නාරම්මල නගර සහා සීමාව තුළ වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙනි හත්පත්තුවේ, උඩුකහ උතුරු කෝරළේ, ලිනියවත්ත නමැති ගමෙහි පිහිටා ඇති 'තිබ්බටුවේ හේන එස්ටේට්' නමැති ඉඩමට සාදා ඇති අංක 1953/1 සහ 1996.09.05 දරන පිඹුරේ ප්‍රකාර කැබලි අංක 02 දරන විශාලත්වය අක්. 0, රූඩ් 0, පර්. 19.8ක් විශාල ඉඩම සහ ඊට අයිති සියලු දේත් සමග මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2009.05.22 දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2003.03.14 දින, දිනමිණ පුවත් පතේ ද 2003.08.08 දින දී, ඩේලි නිව්ස් පුවත් පතේ ද 2008.08.03 දින දී තිනකරන් පුවත් පතේ ද 2008.08.03 දින දී පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*- නාරම්මල සිට කුලියාපිටිය පාරේ සැ. 1/2ක් පමණ ගිය විට, රතස්ගල්ල මෙට්ල් ඉන්ඩස්ට්‍රිස්ට් ආයතනයට යාබදව පාරේ දකුණුපසින් මහා මාර්ගයට මායිම්ව, මෙම දේපළ පිහිටා ඇත. නාරම්මල නගර සීමාවට අයත්ය.

*ගෙවීමේ ක්‍රමය.* -වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදල් ගෙවිය යුතුය :

1. ගැණුම් මිලෙන් 10%,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%,
3. වෙන්දේසියේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%,
4. ලිපිකරු හා නිවේදන ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයේ, ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 037-2222453, ෆැක්ස් අංකය : 037-2222338.

හිමිකම් හා වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30 ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්ලිව්. එම්. අයි. ගල්ලැල්ල (සාමවිනිසුරු),
උසාවි කොමසාරිස්, බලයලත්
වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

අංක 28, නව නීතිඥ සහ වෙළඳ සංකීර්ණය,
කුමාරතුංග මාවත,
කුරුණෑගල.

දුරකථන අංකය : 037-2220062.

04-625

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 1/28245/සීඩී9/794.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ 2009.02.27 දින ගැසට් පත්‍රයේ සහ 2009.03.18 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2009.05.22 වැනි දින පස්වරු 1.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව නගර සභා සීමාව තුළ එගොඩඋයන පිහිටි මාදන්ගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් සකසන ලද 1995.08.18 දිනැති හා අංක 4712 දරන මිණුම් පිඹුරට අනුව ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 7 ක් වූ බිම් කොටස වේ.

මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක එම්/2164/95 හි ලියාපදිංචි වී ඇත.

තවද, අංක 4712 දරන පිඹුරේ දක්වා ඇති සෑම පෙදෙසට අඩි 20 ක් පළල මාර්ගය මතින් මාර්ග අයිතිය සහ අනෙකුත් අයිතීන් ද සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 අප්‍රේල් මස 16 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

04-650/1

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 1/35530/සීඩී4/024.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009.01.16 දින ගැසට් පත්‍රයේ සහ 2009.03.30 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2009.05.22 වැනි දින පෙරවරු 10.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාවේ අබේසේකර පාර පිහිටි මුළුවක්කඩකුඹුර නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු වී. ජී. සමරවීර විසින් සකසන ලද 1994.05.02 දිනැති හා අංක 2357ඒ දරන මිණුම්

පිඹුරේ බෙදා වෙන් කරන ලද ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 13.18ක් වූ බිම් කොටස වේ.

මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක එම් 2032/91 හි ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 අප්‍රේල් මස 16 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

04-650/2

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 1/38094/සීඩී5/078.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ 2008.12.19 දින ගැසට් පත්‍රයේ සහ 2009.01.26 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2009.05.22 වැනි දින පස්වරු 3.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයේ මැද පත්තු ප්‍රාදේශීය සභා සීමාව තුළ ඉහළ හංවැල්ල පිහිටි අඹගහවත්ත නොහොත් උස්වත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු පී. ඩී. එන්. පීරිස් විසින් මැන සකසන ලද 1995.12.28 දින සහ 1996.01.15 දිනැති අංක 698 ඒ දරන මිනුම් පිඹුරේ කැබලි අංක 5 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 ප. 17/35 ක්වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස වේ.

මෙය අංක එන් 169/290 යටතේ අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 අප්‍රේල් මස 16 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

04-650/3

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 1/28244/සීබී9/796.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවාවූද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ 2006.02.17 දින ගැසට් පත්‍රයේ සහ 2006.04.10 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවියයුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේදී 2009.05.22 වැනි දින පස්වරු 01.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ මොරටුව නගර සභා සීමාවේ එගොඩ උයන පිහිටි එකිනෙකට යාව පිහිටි බිම් කොටස් දැන් එක් දේපළක් ලෙස හැඳින්වෙන මාදන්ගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් සකසන ලද 1995.08.18 දිනැති හා අංක 4711 දරන මිණුම් පිඹුරේ දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 07 ක්වූ බෙදා වෙන්කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක එම් 2164/96හි ලියා පදිංචි වී ඇත.

තවද එකී පිඹුරේ දැක්වෙන මාර්ග අයිතිය ද සමඟ වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 අප්‍රේල් මස 16 වැනි දින,
අංක 269, ගාලු පාර, කොළඹ 3.

04-650/4

---

## මහජන බැංකුව -ජාඇල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

ජාඇල නගර සභා සීමාවේ, ලේක්සිටි නිවාස සංකීර්ණයේ නවීන මාදිලියේ වටිනා දෙමහල් නිවසක් සහිත පර්චස් එකොළහයි දශම දෙකයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 11.20) ක ඉඩම මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින්, 2009.05.21 වැනි දින පෙ. ව. 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපළ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2008.10.24 දින ද, ඩේලිනිව්ස්, දිනමිණ, සහ තිනකරන් පුවත්පත්වල 2008.10.24 දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* -ජාඇල මධ්‍යම බස් නැවතුම්පළ අසල පිහිටි, ලේක්සිටි නිවාස සංකීර්ණයේ ප්‍රධාන පිවිසුමෙන් ඇතුල් වී වම්පසට ඇති මාර්ගයේ මීටර් 200ක් පමණ ගොස් නැවත දකුණු පසට මීටර් 50ක් පමණ යන විට වම් පසින් ළමා උද්‍යානයට ආසන්න ලොට් අංක 293 හි දේපල හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.*-වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

1. ගැනුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත කළමනාකරු, මහජන බැංකුව, ජාඇල ශාඛාව වෙත ගෙවිය යුතුය.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක. ප්‍රාදේශීය කළමනාකාර, මහජන බැංකුව, ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක 131, නුවර පාර, බැළුම්මහර, මුදුන්ගොඩ.

දුරකථන අංකය : 033-2222325,
ෆැක්ස් අංකය : 033-2226165.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම ISO 9001 : 2000 සහතිකය ලත්
ශ්‍රී ලංකාවේ පිළිගත්, පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081-2227594
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 5.
දුරකථන අංක : 011-2502680, 011-2585408,
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176,
ඊමේල් : schokman@samera1892.com

04-638

---

## මහජන බැංකුව - ගිරිඋල්ල ශාඛාව

1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

*01 වැනි ඉඩම*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ මැදපත්තු කෝරළේ (නැගෙනහිර) කැලෑ ගෙදර ගමේ පිහිටි කහටගහමුලහේන නමැති ඉඩමට මැන සාදන ලද අංක 195 සහ 1988.11.20 දිනැති පිඹුරේ ලොට් 01 දරන විශාලත්වය (අක්. 01, රූඩ්. 0, පර්.16) විශාල ඉඩම සහ ඊට අයිති සියලු දේත් ;

*02 වැනි ඉඩම*

එකී කැලෑගෙදර ගමේ පිහිටි කහටගහමුලහේන නමැති ඉඩමට එකී අංක 195 සහ 1988.11.20 දරන පිඹුරේ ලොට් 02 සහ 03 දරන විශාලත්වය (අක්. 01, රූඩ් 0, පර්. 16) විශාල ඉඩම සහ ඊට අයිති ගහකොළ, පලතුරු, ගොඩනැගිලි ආදී සියලුදේත් ;

*03 වැනි ඉඩම*

එකී කැලෑගෙදර ගමේ පිහිටි පරගහපිටියේ හේන නමැති ඉඩමට සර්වේ ජනරාල් විසින් සාදනු ලැබ අංක 01 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක F. P. V. 399 දරන පිඹුරේ කැබලි අංක 17 සහ 19 දරන විශාලත්වය (අක්. 04, රූඩ්. 0, පර්. 04) විශාල ඉඩම සහ ඊට අයිති ගහකොල, පලතුරු, ගොඩනැගිලි ආදී සියලුදේත්.

ඉඩම මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ 2009.05.29 දින පෙ. ව. 11.00 සහ ප. ව. 12.00 සිට පිහිටි ස්ථානයේදී ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2007.12.07 දින, දිනමිණ පුවත්පතේ 2008.03.05 දින දීද, ඩේලි නිවුස් පුවත් පතේ 2008.03.05 දින, තිනකරන් පුවත් පතේ 2008.03.05 දින දී ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම :*

*01 වැනි ඉඩම සඳහා :-*

කුරුණෑගල මීගමු ප්‍රධාන මාර්ගයේ සැ. 18ක් පමණ ගියවිට හමුවන දඹදෙණිය නගරයෙන් දකුණට ඇති කටුගම්පොල මාර්ගයේ සැ. 1 1/2ක් පමණ ගිය විට හමුවන දකුණට ඇති කැලෑගෙදර මාර්ගයේ සැ. 1/2ක් පමණ ගිය පසු වම් පසට හමුවන වැලි පාරේ යාර 15ක් ගියවිට මෙම දේපළ හමුවේ.

*02 වැනි ඉඩම සඳහා :-*

ඉහත සඳහන් කැලෑගෙදර මාර්ගයේම උක්ත දේපළ පසුකර ඉදිරියට සැතපුම් 1/4 ක් පමණ ගියවිට පාරේ දකුණු පස මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය .-* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදල් ගෙවිය යුතුය :

1. ගැනුම් මිලෙන් 10%,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%,
3. වෙන්දේසියේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%,

4. ලිපිකරු හා නිවේදන ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත මහජන බැංකුව කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයේ, ප්‍රාදේශීය කළමණාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංකය : 037-2222453, ෆැක්ස් අංකය :037-2222338.

හිමිකම් හා වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30 ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්ලිව්. එම්. අයි. ගල්ලැල්ල (සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 28, නව නීතිඥ සහ වෙළඳ සංකීර්ණය,
කුමාරතුංග මාවත,
කුරුණෑගල.
දුරකථන අංකය : 037-2220062.

04-623

---

## යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු ලිමිටඩ්

1990 අංක 4 දරන බැංකුව විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වැනි වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 233 දරන උකස් බැඳුම්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මහනගර සභා සීමාව තුළ වැල්ලවත්ත, රෝහිණී පාරේ පිහිටි වරිපනම් අංක 34 දරන බලයලත් මානක කේ. කේ. තිරුනවුකරසු විසින් 1976.07.12 දින මැන සාදන ලද අංක 1998 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 12ඒ (වැල්ලවත්ත ලියාපදිංචි පිඹුරු අංක 2 හි දැක්වෙන ලොට් 6හි දැක්වෙන ලොට් බී ඒකාබද්ධව සෑදුනු ඉඩමේ අනු බෙදුමක් වන 635බීසී12හි අනුබෙදුමකි).

අ. 0, රූ. 0, පර්. 13.6ක වපසරියකින් යුතු ඉඩම සහ එහි පිහිටි ගහකොළ, වැවිලි, ගොඩනැගිලි සහ සියලු දේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, කොළඹ 06, අයි. බී. සී. පාරේ, අංක 30/1 දරන ස්ථානයේ මෙහි මින්මතු 'උකස්කරු' වශයෙන් හඳුන්වනු ලබන හැසොනයිට් ප්‍රොපර්ටි ඩිවලපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ප්‍රසිද්ධ නොතාරිස් එම්. එම්. රේණුකා පී. ගුණසේකර විසින් 2006 මාර්තු 30 වැනි දින ලියා සහතික කරන ලද අංක 233 දරන උකස්කරය ලියා අත්සන් කරනු ලැබ ඇති බැවින් ද, ස්වකීය ජංගම ගිණුමෙන් වරින්වර ණය අත්තිකාරම් සහ අයිරාවන් වශයෙන් බැංකු පහසුකම් ලබාගෙන ඇති බැවින් ද, යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු ලිමිටඩ් විසින් අප වෙත පවරන ලද බලය යටතේ,

2009 මැයි මස 19 වැනි (අඟහරුවාදා) දින පෙරවරු 11.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් මුදල් මුදලින් ගෙවිය යුතුය :

1. ගැණුම් මිලෙන් 25%ක් (සියයට විසිපහක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එක) විකුණුම් බදු,
3. තීන්දු වූ මිලෙන් 2 1/2%ක් වන වෙන්දේසිකරුගේ කොමිස් මුදල (සියයට දෙකහමාර),
4. රු. 1,50,000ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ සහ සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 5,000,
7. ගැණුම් මිල මත 12% වැට් බදු.

ගැණුම් මිලෙන් 75%ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර යුනියන් බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක : 011-2370694, 2370703.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා ISO 9001 : 2000 සහතිකලත්
ශ්‍රී ලංකාවේ එකම වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 081 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081 2224371
ඊමේල් : schokmankandy@sltnet.com

*නගර කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය :*
290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176,
ඊමේල් : schokman@samera1892.com

Web : www.schokmanandsamarawickreme.com

04-633

---

## මහජන බැංකුව - දෙනියාය ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

**මහජන බැංකුව - දික්වැල්ල ශාඛාවෙන් ප්‍රසිද්ධ වෙන්දේසියක්**

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත 2009.05.21 දින පෙ. ව. 11.00ට මෙහි පහත විස්තර වන දේපළ, දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

## උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළේ කොටපොල පිහිටි නවදනි හෙවත් නයින්දාව නමැති ඉඩම බෙදා වෙන්කළ ජේ. ඩබ්. නීස් මිනින්දෝරු මහතාගේ අංක 78 සහ 1932.02.19, 20 සහ 21 දිනැති පිඹුර ප්‍රකාර ලොට් අංක 9, 10, 11, 12, 13, 14, 15 සහ 16 දරන බිම් කොටස් වන අක්කර හතළිස් එකයි, පර්චස් තිස් දෙකක් (අක්. 41, රූඩ් 0, පර්. 32) ලෙස සඳහන් වුවද වඩා නිවැරදි ලෙස අක්කර හතළිහයි, රූඩ් තුනයි, පර්චස් තිස් දෙකක් (අක්. 40, රූඩ්. 03, පර්. 32) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි වැවිලි ගොඩනැගිලි යනාදි සියළු දේ ද වේ.

වැඩි විස්තර සඳහා 2008.09.19 දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2008.11.19 දින දිනමිණ පුවත්පතේ ද පළකර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*- දෙනියාය නගරයේ සිට සැ. 1 1/2 ක් පමණ කොටපොල නගරයට පැමිණෙන විට දෙනියාය වත්තට හැරෙන පාර හමුවේ. එම පාරේ බටාදුරට යන මාර්ගයේ සැ. 1 1/2ක් පමණ ගමන් කරන විට එම පාරේ වම් පසින් දිය පාරක් හරහා යන පටු මාර්ගයක් හමු වේ. එම පටු මාර්ගය මෙම වත්තට යන පාර වේ.

*ගෙවීමේ ක්‍රමය.*-සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

01. ගැණුම් මිලෙන් 10% ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට විකුණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් ගැණුම් මිලෙන් 2 1/2 ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක් ද,
05. විකුණුම් වියදම හා වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මාතර, පිට්ටනිය පාරේ, අංක 38/1ඒ දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකාර මහතාට ගෙවිය යුතුය.

දුරකථන අංක - 041 - 2222792, 2222822 හා 2224773,
ෆැක්ස් අංකය - 041 - 2222688.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත්, දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ජී. පී. ආනන්ද (සාමවිනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම - මාතර.

දුරකථන අංක : 041-2228731,
071-4438516.

04-621

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - අවිස්සාවේල්ල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර බලයලත් මානක එස්. ඉද්දමල්ගොඩ විසින් 1981 ජනවාරි මස 15 වන දින සාදන ලද අංක 1371 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, උඩුගහපත්තු හේවාගම් කෝරළේ, කලුඅග්ගල පිහිටි නාගහවත්ත ඉඩමේ, බෙදා වෙන් කරන ලද ලොට් 3 දරන අක්කර තුනයි, රූඩ් එකයි, පර්චස් දහසයක් (අ. 3, රූ. 1, පර්. 16) විශාල ඉඩම සහ ගසකොළ, වගාවන් සහ එහි පිහිටි සියළුදේත් සමග වේ.

කාරියවසම් පුවක්පිටියගේ කුමාරසිරි සහ වෙල්පල්ලෙ ආරච්චිලාගේ පද්මිණී රණසිංහ ණයකරුවන්/උකස්කරු හැටියට ද, ඔවුන් විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ, 2009 මැයි මස 21 වැනි දින පෙ. ව. 11.30ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2008.09.19 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* සහ ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2009.04.30 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2009.05.05 වන දින දිවයින සහ ද අයිලන්ඩ් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.*-කොළඹ - අවිස්සාවේල්ල ප්‍රධාන පාරට මායිම්ව සහ 44 වැනි කිලෝමීටර් කණුවට ආසන්නව වම්පසින් කොස්ගම තරුණ මධ්‍යස්ථානයට යාබදව මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*-විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය:

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
4. නොතාරිස් ගාස්තුව රු. 2,000,
5. ලිපිකරු හා ඝෝෂක වේතනය රු. 500,
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්
7. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව 90% විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ අවිස්සාවේල්ල ශාඛාවේ තැන්පත් කළ යුතුයි.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්,
කොළඹ වාණිජ මහාධිකරණය සහ දිසා අධිකරණය
බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
රාජ්‍ය සහ වාණිජ බැංකු.
අංක 99, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථනය/ෆැක්ස් : 011 2445393.

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී,
78, කොළඹ පාර, අවිස්සාවේල්ල,
දුරකථන : 036 2231301,036 2231303,036 2231304,
ෆැක්ස් අංකය : 036- 2231302.

04-641

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

කොළඹ 05, නාරාහේන්පිට, කිරුළ පාර, අංක 92 හි පදිංචි සීමාසහිත කුරින් ඉන්ටර් නැෂනල් (පුද්ගලික) සමාගමේ ණය වගකීම් සඳහා උකස් කළ වලපනේ ප්‍රාදේශීය සභා සීමාවේ පන්නල හි පිහිටි නිකවෙල, කහටගහලන්දහේන, නිකවෙල, තැන්නහේන සහ නිකවෙලහේන නමැති ඉඩම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2008.09.12 දිනැති අංක 1567 දරන ගැසට් පත්‍රයේ හා 2008.09.05 දිනැති ඩේලිනිව්ස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගතහැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍ර පිහිටි ස්ථානයේ දී ම 2009.05.30 වැනි දින පෙ. ව. 11.00 ට කෝට්ටේ, පිටකෝට්ටේ මහානාම ඩ්‍රයිව්, අංක 474 හි පදිංචි වෙන්දේසිකාර, ආර්. එස්. එම්. වෙන්දේසිකාර මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### පළමුවැනි උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, ඔය පළාත කෝරළයේ වලපන හි වලපනේ ප්‍රාදේශීය සභා සීමාවේ පන්නල හි පිහිටි 'නිකවෙල කහටලන්දහේන නිකවෙල තැන්නහේන සහ නිකවෙලහේන' නැමැති යැබැදි ඉඩම් වලින් බලයලත් මිනින්දෝරු ඒ. එස්. එම්. අස්වද් විසින් සාදන ලද 1993 අගෝස්තු මස 10 දිනැති අංක 1950 දරන පිඹුරේ විස්තර කළ ලොට් අංක 1, 2, 3, 4, 5 සහ 6 වශයෙන් සඳහන් කළ බෙදන ලද ඉඩම් කැබලි ඉහත සඳහන් අංක 1950 දරන පිඹුරේ විස්තර කළ යාබැදිව පිහිටා ඇති ඉහත සඳහන් ඉඩම් කැබැලි 1, 2, 3, 4, 5 සහ 6 එකම ඉඩමක් සේ යාකර ඇති අතර, උතුරට : ආර්. එම්. ගුණතිලකට අයත් නිකවෙල, කුඹුර සහ ටී. එම්. ප්‍රේමතිලකට අයත් නිකවෙල කුඹුර ද, ඊසානට : ටී. එම්. ප්‍රේමතිලකට අයිති නිකවෙල කුඹුර වෙන් කරන ඇල සහ පී. බී. එම්. හේරත්ට අයත් නින්දපිටිය නැමැති කුඹුර ද, නැගෙනහිරට : එස්. එම්. හේරත්ට අයිති දේපල සහ ඩබ්. එම්. විජේසිංහට අයිති දේපළ දකුණට : කාණුව සහ නුවර සිට මහියංගන දක්වා මහා මාර්ගය ද, බස්නාහිරට : කේ. ඩබ්. එම්. හීන්මැණිකාට අයිති නිකවෙලහේන සහ ටී. එම්. ප්‍රේමතිලකට අයිති නිකවෙලකුඹුර වෙන් කරන ඇල ද, වයඹට : ටී. එම්. ප්‍රේමතිලකගේ නිකවෙල කුඹුර වෙන්කරන ඇල ද, මායිම්ව අක්කර පහයි රූඩ් එකයි පර්චස් පහළොවක් (අ. 5 රූ. 1 පර්. 15) ප්‍රමාණයෙන් යුත් ඉඩම සමග එහි පිහිටි සියලු දේ වේ. මෙම ඉඩම නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ 0155/127 හි ලියාපදිංචි කර ඇත.

### දෙවැනි උපලේඛනය

බන්ධනදායීට අයත් භාණ්ඩ තොග ඇතුළු වංවල යන්ත්‍රසූත්‍ර හා බඩුබාහිරාදිය පහත සඳහන් වේ.

| *Index Quantity No.* | *Name of the Machine* | *Brand Name* | *Model Numbers* | *Made in* | |
|---|---|---|---|---|---|
| 1. | Single Needle Lock Stitch | Juki | DDL - 8500 | Japan | 122 |
| 2. | Single Needle Lock Stitch | Juki | DL - 880 | Japan | 48 |
| 3' | Single Needle Lock Stitch | Typical | GC - 615011 | - | 32 |
| 4. | Single Needle Lock Stitch Under Bed Trimmer | Juki | DDL - 8700 -7 | Japan | 8 |
| 5. | Single Needle Lock Stitch Under Bed Teimmer | Kaixuan | KX - 8500 - 5- 6D | Japan | 4 |
| 6. | Single Needle Under Bed Trimmer | Typical | GC6180ME3 | Japan | 30 |
| 7. | Single Needle Edge Cutter | Juki | DLM - 5200 | Japan | 3 |
| 8. | Single Needle Edge Cutter | Toyota | LS2 - B 347 | Japan | 3 |
| 9. | Double Needle | Juki | LH - 3128 | Japan | 0 |
| 10. | do. | Brother | LT 2 - B 842 - 3 | German | 7 |
| 11. | Overlock (5 thread) | Juki | MO 3616/M02366N | Japan | 16 |
| 12. | Overlock (5 thread) | Typical | GN - 2000-5 | Japan | 7 |
| 13. | Overlock (3 thread) | Juki | 2354N | Japan | 1 |
| 14. | Overlock (6 thread) | Kaxuan | KX 767 | Taiwan | 2 |
| 15. | Overlock (6 thread) | Pegasus | M600 | Taiwan | 13 |
| 16. | Button Hole | Brother | LH -4-D814 | German | 5 |
| 17. | Key Button Hole/ Eye Button Hole | Durkopp Addler AG | 0558-241391 | German | 1 |
| 18. | Key Button Hole/Eye Button Hole | Reece | 101 | USA | 3 |

| *Index Quantity No.* | *Name of the Machine* | *Brand Name* | *Model Numbers* | *Made in* | |
|---|---|---|---|---|---|
| 19. | Multi Needle Chain Stitch | Kansai special | DFB1412P | Japan | 4 |
| 20. | Kansai Loop Machine | Kansai Special | B - 200 C | Japan | 1 |
| 21. | Flatlock Machine | Pegasus | W 664 - 03SB | German | 1 |
| 22. | Blind Stitch/Blind Hem | US Stitch Line | SL 718- 2 | | 4 |
| 23. | Feed of the Arm | Juki | MS - 1190M | Japan | 4 |
| 24. | Feed of the Arm | Juki | MS- 191 | Japan | 2 |
| 25. | Velcor Attached Electronic | Juki | LK 1930 | Japan | 1 |
| 26. | Button Attach Electronic | Juki | LK - 1903 | Japan | 3 |
| 27. | Button Attach (Lock Stitch) | Juki | LK - 1851 | Japan | 2 |
| 28. | Button Attach (Chain Stitch) | Juki | MB - 373 | Japan | 4 |
| 29. | Snap Button Attach Machine | Juki | | Japan | 3 |
| 30. | Bartac Machine Electronic | Juki | LK - 1900 | Japan | 3 |
| 31. | Bartac Normal | Juki | LK - 1850 | Japan | 5 |
| 32. | Welt Pocket Attach Machine | Durkopp Addler | 0935-00024600 | German | 1 |
| 33. | Zigzag Machine | Kaixuan | 20 U 53 | | 3 |
| 34. | Cutting Machine 08" (Blue Streak II) | Eastman | 629 X | USA | 1 |
| 35. | Cutting Machine 10" (Blue Streak (11) | Eastman | 629 X | USA | 2 |
| 36. | Cutting Machine 10" | Eastman | 829 | Taiwan | 1 |
| 37. | Cloth Drill maker 08" | Eastman | CD - 3 | USA | 1 |
| 38. | Band Knife (3700 m.m.) | C. K. S. | | Japan | 1 |
| 39. | End Cutter Machine | Sulee | 2611N | Japan | 2 |
| 40. | Pattern Cutter (Template Making) | Racing | K- 1 II | | 1 |
| 41. | Needle Search FM | Cintex | | England | 1 |
| 42. | Complete Topper (Big Jim) | Comptel Topper | 330 | Italy | 2 |
| 43. | Pony Stain remover | Pony | 20065 | Italy | 1 |
| 44. | Fusing Machine | Korea fiblon | HBP H - 100D | Korean | 1 |
| 45. | Fusing Machine | | NIIG - 900 | China | 1 |
| 46. | Fabric inspection machine | | | China | 1 |
| 47. | Light Box (the Judge 11) | Gretagmac Beth | | Hongkong | 1 |
| 48. | Thread Sucker | Toyota | | Japan | 1 |
| 49. | Susmen Electric Boiler (24 KW) | Susmen | ES 24 | | |
| 50. | Susmen Electric (Boiler (68 KW) | Susmen | ES 72 | | 1 |
| 51. | Striping Machine | - | - | | 1 |
| 52. | Collar Turn machine | - | - | | 2 |
| 53. | Air Compressor (4.0kw) | - | - | | 1 |
| 54. | Air Compressor (1.5kw) | Europa 440 | - | | 1 |
| 55. | Generator (200 kw) | Caterpilla r | S. No. 852120 03 Model No. 3306D1 | U. S. A | 1 |
| 56. | Generator (2KW) | Sri Ram Honda | SA - 4 S. No. 8 JF 007 52 | | 1 |
| 57. | Pre Fabricated Steel Racks | | | South Africa | 1 |

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, පන්නල හි පිහිටි 'කීර්ති බණ්ඩාරපුර' නැමැති ඉඩමේ පිහිටි සීමාසහිත කුටින් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම නමැති පරිශ්‍රයෙහි (මින් පසු බන්ධනදායී සතු යන්ත්‍රසූත්‍ර උපකරණ යනුවෙන් සාමූහිකව සඳහන් සියල්ල) විස්තර කළ තනි හා සියලු චංචල දේපළ සියල්ල හා ගෘහභාණ්ඩ උපකරණ සවිකිරීම් හා භාණ්ඩ මින්පසු විටින්විට අඛණ්ඩව එකී පරිශ්‍රයේ තබා ඇති හෝ පරිශ්‍රයට ගෙනඑනු ලබන ඉහත විස්තර කළ හා අනෙකුත් චංචල දේපළ සියල්ල හා මින්පසු බන්ධනදායී විසින් විටින්විට ඉවත් කරන ඉහත කී යන්ත්‍රසූත්‍ර උපකරණ ද බන්ධනදායීගේ චංචල දේපළ ද බන්ධනදායීගේ වෙළඳාම් හෝ ව්‍යාපාර හෝ යන්ත්‍රසූත්‍ර උපකරණ දේපළ ගබඩාව හා අනෙකුත් චංචල දේපළ ද වේ.

මහජන නොතාරිස් රේණුක ද සිල්වා සහ මහජන නොතාරිස් මනෝහරි ගුණසේකර (විවාහයට පෙර) වලිසිංහ විසින් සහතික කරන ලද පිළිවෙළින් 1998.06.18 හා 1996.11.20 දිනැති අංක 264 හා 1023 දරන උකස් බැඳුම්කර හා මහජන නොතාරිස් ධම්මික කිතුල්ගොඩ විසින් සහතික කරන ලද 2006.10.26 දිනැති අංක 1635 හා 1636 දරන උකස් බැඳුම්කර දෙකක්.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ඩී. සිල්වා,
සම්බන්ධතා කළමනාකරු,
අයකරගැනීම් - ආයතනික.

2009 අප්‍රේල් මස 07 වැනි දින,
අංක 4, ලංකා බැංකුව,
ලංකා බැංකු මාවත, කොළඹ 01.

04-647

---

**මහජන බැංකුව - මාතර ධර්මපාල මාවත ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 'ඩී' වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත 2009.05.25 වැනි දින පෙ. ව. 10.30ට මෙහි පහත විස්තර වන දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය.-* දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කන්දබඩ පත්තුවේ, නරවැල්පිට පිහිටි තුසෙව්මිනිහාගෙවත්ත නමැති ඉඩම 2005.07.16 දිනැති එම්. එල්. එම්. රශ්මි බලයලත් මිනින්දෝරු මහතා විසින් මැන සාදන ලද අංක 2358 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ 'ඒ' අක්ෂරය දරන රූඩ් එකයි පර්චස් අටක් (අක්. 0, රූ. 1, පර්. 8) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියලු දැය ද වේ.

වැඩි විස්තර සඳහා 2008.02.29 දිනැති *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2008.03.14 දින දිනමිණ පුවත්පතේ ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.-* හක්මණ, ඇල්ලෙවෙල මාර්ගයේ කි. මී. 2 1/2ක් පමණ යනවිට නරවැල්පිට හන්දිය හමුවීමට පෙර පාරේ දකුණු පස මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට විකුණුම් මිලෙන් 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
5. විකුණුම් වියදම් හා වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මාතර, එක්ස්ප්ලනේඩ් පාරේ, අංක 38/1 ඒ දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කළමනාකාර මහතාට ගෙවිය යුතුය.

දුරකථන අංක : 041-2222792, 2222822 හා 2224773.
ෆැක්ස් අංකය : 041-2222688.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 10% මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ජී. පී. ආනන්ද (සාමවිනිසුරු)
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම - මාතර,
දුරකථන අංකය : 041-2228731.

04-620

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.